# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2339/09 - 2023 ජූලි මස 04 වැනි අඟහරුවාදා - 2023.07.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී-බී. 8/2007 (III)

**2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත**

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 සහ 38 වැනි වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 67 වන වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කංචන විජේසේකර,**
විදුලබල හා බලශක්ති අමාත්‍ය.

2023 ජුනි මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2023 අංක 1 දරන නිශ්චිත බලශක්ති පරිභෝජන පිල් ලකුණු පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලය විසින් මෙහි I වන උපලේඛනයේ I වන කොටසේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි ජාත්‍යන්තර සම්මත කර්මාන්ත වර්ගීකරණයට (අයි එස් අයි සී) අනුව කාණ්ඩවලට වර්ගීකරණය කරන ලද නිමාවන් සඳහා (මෙහි මින්මතු ("එස් ඊ සී") පිල් ලකුණු යනුවෙන් සඳහන් කරනු ලබන) නිශ්චිත බලශක්ති පරිභෝජන පිල් ලකුණු ස්ථාපිත කිරීමේ අරමුණ වෙනුවෙන් මෙම නියෝගවල විධිවිධානවලට අනුව කටයුතු කරනු ලැබිය යුතු ය.

03. (1) මණ්ඩලය විසින් එවැනි ආයතනයකින් යම් නිමාවක් -

(අ) එම නිමාව විදුලිය සහ අනෙකුත් ආකාරයෙන් පරිභෝජනය කරනු ලබන බලශක්තිය, සුවපහසු අවකාශයක් සතු වර්ගඵල ඒකකයකට වැයවූ විදුලි ඒකක ප්‍රමාණය ($kWh/m^2$) ලෙස හෝ වෙනත් නිෂ්පාදන පරාමිතියක් සඳහා වැයවූ විදුලි ඒකක ප්‍රමාණය ලෙස, මෙහි I වන උපලේඛනයේ III වන කොටසේ සඳහන් බලශක්ති පිල් ලකුණට අනුකූල විය යුතු බවට ; සහ

(ආ) මෙහි I වැනි උපලේඛනයේ IV වන කොටසේ දක්වා ඇති පරිදි අදාළ නිමාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු අධිකාරියට ලබා දිය යුතු බවට,

එවැනි නිමාවකින් ඉල්ලා සිටිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, "නිමාවක කළමනාකරු" ලෙස හඳුන්වනු ලබන, යම් නිමාවක් පවත්වාගෙනයාමේ වගකීම දරන යම් තැනැත්තෙකු හට මේ පනතේ 36(2)(ආ) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුකූලව ආයතනයේ විස්තරාත්මක බලශක්ති පරිභෝජන වාර්තාවක් යම් කිසි වර්ෂයක සෑම කාර්තුවක්ම අවසාන වීමෙන් දින 14 ක් ඉකුත්වීමට පෙර අධිකාරියට ලබා දීමට නියම කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය විසින් නියම කොට ඇති පරිදි මේ නියෝගවල 3(2) වන නියෝගය යටතේ නිශ්චිතව දක්වා ඇති බලශක්ති පරිභෝජන තොරතුරු වාර්තා කිරීම සඳහා, යම් නිමාවක නිමා කළමනාකරුගේ අනුමැතිය ඇතිව නිමාවේ යම් සේවානියුක්තයකු, බලශක්ති කළමනාකරු ලෙස මණ්ඩලය විසින් පත්කළ යුතු ය.

(4) 3(3) නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි බලශක්ති කළමනාකරු ලෙස ආයතනයේ සුදුසුකම්ලත් සේවානියුක්තයකු පත් කිරීමට මණ්ඩලයට නොහැකි වූ අවස්ථාවක දී, නිමාවේ කළමනාකරු විසින් බලශක්ති කළමනාකරුවකුගේ කාර්යය ඉටුකර ගැනීම සඳහා පනතේ 38 වැනි වගන්තිය යටතේ මණ්ඩලය විසින් විධිමත් ලෙස ප්‍රතීතනය කරනු ලැබූ නිමාවේ සේවකයකු නොවන බලශක්ති කළමනාකරුවකුගේ සේවය ලබාගත යුතු ය.

(5) මේ නියෝගයේ 3(1)(ආ) වන සහ 3(2) වන නියෝග යටතේ දක්වා ඇති පරිදි තොරතුරු වාර්තා කිරීමට යම් නිමාවක කළමනාකරු අසමත් වූ අවස්ථාවක, පනතේ 36(2)(අ) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ආයතනයේ කළමනාකරුගේ කැමැත්ත පරිදි මණ්ඩලය විසින් විධිමත් ලෙස ප්‍රතීතනය කරනු ලැබූ බලශක්ති කළමනාකරුවෙකුට හෝ බලශක්ති සේවා සපයන්නකුට යම් නිමාවක් විසින් මෙහි I වන උපලේඛනයේ III වන කොටසේ දක්වා ඇති පිල් ලකුණ අනුගමනය කරනු ලබන බවට සහතිකවීම සඳහා මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවන්හි දී නිමාවක පරිශ්‍රයකට, භූමියකට හෝ නිමාවකට ඇතුලු වී ඒවා පරීක්ෂා කිරීමට, තොරතුරු ලබා ගැනීමට, තොරතුරු තහවුරු කර ගැනීමට හෝ වෙනත් යම් පරීක්ෂාවක් සිදු කිරීමට හැකි ය.

(6) යම් නිමාවක නිශ්චිත බලශක්ති පරිභෝජනය, මෙහි I වැනි උපලේඛනයේ III වැනි කොටසේ සඳහන් අදාළ කාණ්ඩයේ එස්. ඊ. සී. පිල් ලකුණ අභිබවා පිළිගත නොහැකි ඉහළ මට්ටමක වාර්තා වන අවස්ථාවක දී, පනතේ 37 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව විස්තරාත්මක බලශක්ති විගණන වාර්තාවක් හා බලශක්ති භාවිතය පිළිගත හැකි මට්ටමට අඩු කිරීම සඳහා අවශ්‍ය වන බලශක්ති කාර්යක්ෂමතා වර්ධනය හා සංරක්ෂණය (ඊ ඊ අයි සහ සී) පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස මණ්ඩලය විසින් නිමාවේ කළමනාකරුගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(7) නිමාවේ කළමනාකරු විසින් බලශක්ති විගණන සිදුකිරීම, සාමාන්‍ය බලශක්ති පරිභෝජන වාර්තා (පී.ඊ.සී) පිළියෙල කිරීම හා ප්‍රතිකර්මයට පියවර පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම යන කාර්ය ඉටු කර ගැනීම සඳහා මණ්ඩලය විසින් ප්‍රතීතනය කරනු ලැබූ අවස්ථාවෝචිත පරිදි බලශක්ති විගණකවරයකුගේ හෝ බලශක්ති සේවා සපයන්නෙකුගේ සේවය ලබා ගත යුතු ය.

(8) මෙම නියෝගවල 3(4) වන, 3(5) වන සහ 3(7) වන නියෝගවල සඳහන් ඕනෑම බලශක්ති කළමනාකරුවෙකු, බලශක්ති විගණකවරයෙකු හෝ බලශක්ති සේවා සපයන්නකු, නියම කරනු ලැබූ සුදුසුකම්වලට අනුව පනතේ 38(1) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, මණ්ඩලය විසින් පත් කරනු ලැබූ සහ ප්‍රතීතන සහතිකයක් නිකුත් කරනු ලැබූ පුද්ගලයකු විය යුතු ය.

(9) ආයතනයක නිශ්චිත බලශක්ති පරිභෝජන වාර්තාව (එස්. ඊ. සී.) ලැබීමෙන් පසු, මෙහි III වන උපලේඛනයේ දක්වා ඇති පරිදි වූ බලශක්තිය පරිහරණය කිරීමේ ශ්‍රේණිගත කිරීම මත පදනම්ව අදාළ වර්ගයේ ආයතනයේ බලශක්ති කාර්යසාධන මට්ටම මත අධිකාරිය විසින් නිමාවට සුදුසු ශ්‍රේණිගත කිරීමක් සිදු කරනු ලැබිය හැකි ය.

(10) අධිකාරිය විසින් යම් නිශ්චිත කාණ්ඩයක ඉහළම බලශක්ති කාර්ය සාධන මට්ටමකින් යුත් නිමාවන් දහයක ලැයිස්තුවක් සහ මෙම නියෝගවලට අනුකූල වීමට අපොහොසත් වන නිමාවන්වල ලැයිස්තුවක් ද කළින් කළ ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

4. මේ නියෝගවල -

"පනත" යන්නෙන් 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත අදහස් වේ ;

"අධිකාරිය" යන්නෙන් 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අදහස් වේ ;

"නිශ්චිත බලශක්ති පරිභෝජන පිල් ලකුණු" (එස් ඊ සී) යන්නෙන් ජාත්‍යන්තර සම්මත කර්මාන්ත වර්ගීකරණයේ (අයි එස් අයි සී) සිව් අක්ෂර මට්ටම් මගින් ලබා දී ඇති වර්ගීකරණය යටතේ සැසඳිය හැකි බවට සලකනු ලබන්නා වූ ද සමාන ක්‍රියාත්මක තත්ත්වයන් පෙන්නුම් කරන්නා වූ ද නිමාවන් සමූහයකින් ප්‍රදර්ශනය වන විශේෂිත බලශක්ති පරිභෝජනයන් අදහස් වේ ;

"මණ්ඩලය" යන්නෙන් පනතේ 3 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පත් කරන ලද අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය අදහස් වේ ;

"කාණ්ඩය" යන්නෙන් ජාත්‍යන්තර සම්මත කර්මාන්ත වර්ගීකරණයේ (අයි එස් අයි සී) සිව් අක්ෂර මට්ටම් මගින් සලසා ඇති වර්ගීකරණය යටතේ සැසඳිය හැකි බවට සලකනු ලබන සමාන මෙහෙයුම් තත්ත්වයන් ප්‍රදර්ශනය කරන්නා වූ නිමාවන් සමූහයක් අදහස් වේ ;

"සුවපහසු අවකාශය" යන්නෙන් බාහිර පරිසරයෙන් වෙන්ව ආවරණය කරන ලද ගොඩනැගිල්ලක, බාහිර පරිසරයට වඩා වෙනස් තාප සුවපහසු මට්ටමක් පවතින වර්ග ප්‍රමාණය අදහස් වේ ;

"ඊ ඊ අයි සහ සී" යන්නෙන් ආයතනයක බලශක්ති කාර්යක්ෂමතාව වර්ධනය කිරීමත් බලශක්ති සංරක්ෂණය සඳහාත් ගනු ලබන විවිධ ක්‍රියාමාර්ග අදහස් වේ ;

"නිමාව" යන්නෙන් ව්‍යාපාර/වාණිජ කටයුතු හෝ නිවාස සංකීර්ණ ද ඇතුළත්ව එක් ස්ථානයක හෝ ස්ථාන කිහිපයක පිහිටුවා ඇති ගොඩනැගිල්ලක්/ගොඩනැගිලි සමූහයක්, සහාධිපත්‍ය දේපළක් භාවිතා කරමින් සේවා ලබාදෙන හෝ නිෂ්පාදන කටයුතු සිදුකරන ව්‍යාපාරයක් අදහස් වේ ;

"නිමාවක කළමනාකරු" යන්නෙන් යම් නිමාවක කළමනාකරණය සහ පරිපාලනය සම්බන්ධයෙන් වගකීම දරන පුද්ගලයා අදහස් වේ ;

"ජාත්‍යන්තර සම්මත කර්මාන්ත වර්ගීකරණය (අයි එස් අයි සී)" යන්නෙන් එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය මගින් ප්‍රකාශයට පත් කරන ලද නවතම ආර්ථික වර්ගීකරණය අදහස් වේ ;

"සාමාන්‍ය බලශක්ති පරිභෝජන (ජී ඊ සී) වාර්තා" යන්නෙන් නිමාවේ සැබෑ බලශක්ති පරිභෝජනය, මෙහෙයුම් විධි සහ අනෙකුත් තොරතුරු මත පදනම් ව ඇස්තමේන්තු කරන ලද, බලශක්ති විගණකවරයෙකු විසින් විධානය කළ විටෙක අධිකාරිය සඳහා සම්පාදනය කරනු ලබන, කාලගුණ විද්‍යාත්මක වර්ෂයක් (ටී එම් වයි) තුළ, නිමාවක වාර්ෂික බලශක්ති පරිභෝජන වාර්තාව අදහස් වේ.

"නිශ්චිත බලශක්ති පරිභෝජනය" (එස් ඊ සී) යන්නෙන් යම් නිමාවක සේවා ඒකකයක් හෝ නිෂ්පාදනය ඒකකයක් නිපදවීම, සැපයීම හෝ ලබාදීම සඳහා වැයවන බලශක්ති ප්‍රමාණය අදහස් වේ;

"සාමාන්‍ය කාලගුණ වර්ෂය" යන්නෙන් ලබා ගත හැකි දිගු කාලීන කාලගුණික දත්ත මාලාවකින් වඩාත් හොඳින් නියෝජනය වන මාස තෝරා ගැනීමෙන් සකස් කරන ලද පැයෙන් පැය කාලගුණික දත්ත සහිත කෘතිම වූත් නියෝජ්‍ය වූත් වර්ෂයක් අදහස් වේ.

## I වැනි උපලේඛනය

### *I වැනි කොටස*

(නියෝග 2, 3(1), 3(5), 3(6))

**නියෝගය පනවනු ලබන කාණ්ඩ**

| පන්තිය | 471 කාණ්ඩය - සිල්ලර විකුණුම් වෙළඳසැල් (විශේෂිත නොවන) |
|---|---|
| 4711 | ආහාර, පාන හෝ දුම්කොළ ප්‍රමුඛ වූ සිල්ලර විකුණුම් වෙළඳසැල් (විශේෂිත නොවන) |
| 4719 | අනෙකුත් විශේෂිත නොවන සිල්ලර විකුණුම් වෙළඳසැල් |
| එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සම්මත කර්මාන්ත වර්ගීකරණයේ (ISIC) 4 වන ප්‍රතිශෝධනයට අනුව ජී කොටස යටතේ තොග සහ සිල්ලර විකුණුම් ; මෝටර් රථ හා යතුරු පැදි අලුත්වැඩියාව යටතේ 47 අංශයේ සිල්ලර විකුණුම් ; මෝටර් රථ හා යතුරු පැදි අලුත්වැඩියා හැර යන කොටස් යටතේ වර්ගීකරණය කොට ඇත. | |
| **පන්තිය** | **641 කාණ්ඩය - මූල්‍ය මැදිහත්වීම්** |
| 6411 | මහ බැංකු කටයුතු |
| 6419 | වෙනත් මූල්‍ය මැදිහත්වීම් |
| 6420 | පරිපාලන සමාගම්වල මෙහෙයුම් |
| 6430 | භාරයන්, අරමුදල් වැනි සමාන මූල්‍ය ආයතන |
| **පන්තිය** | **649 කාණ්ඩය - රක්ෂණ හා විශ්‍රාම අරමුදල් කටයුතු නොවන වෙනත් මූල්‍ය සේවා** |
| 6491 | කල් බදුදීම් |
| 6492 | වෙනත් ණය පහසුකම් සැපයීම් |
| 6499 | වෙනත් ස්ථානයක සඳහන් නොවන රක්ෂණ හා විශ්‍රාම අරමුදල් කටයුතු නොවන වෙනත් මූල්‍ය සේවා |
| එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ප්‍රමිති කර්මාන්ත වර්ගීකරණයේ (ISIC) (4 වන සංශෝධනය) මූල්‍ය සහ රක්ෂණ කටයුතු පිළිබඳ K වගන්තිය යටතේ එකී ISIC හි රක්ෂණ සහ විශ්‍රාම අරමුදල් කටයුතු හැර මූල්‍ය සේවා කටයුතුවලට අදාළ 64 වන අංශය යටතේ වර්ගීකරණය කොට ඇත. | |

## *II වැනි කොටස*

| *යෝග්‍යතා ලක්ෂණ* | *විස්තරය* |
|---|---|
| සේවා සපයන ප්‍රදේශය : | එක් ආයතන ජාලයකට අයත් තනි ගොඩනැගිල්ලක හෝ ගොඩනැගිලි සමූහයක සම්පූර්ණ සේවා සපයන ප්‍රදේශය වර්ග මීටර් 5000 ට වැඩි. මෙහි දී එක් එක් ගොඩනැගිල්ලේ මහල් ගොඩනැගිලි හෝ ස්ථාන පිළිබඳ විස්තරාත්මක ලැයිස්තුවක් අදාළ ස්ථානයේ සේවා සපයන බිම් වර්ග ප්‍රමාණය සමග ලබාදිය යුතු ය. |
| කාර්යාල කටයුතු සිදුවන කාලය : | දිවා කාලය තුළ වැඩකරන ආයතන සම්බන්ධයෙන්, විවෘත කර තබන වේලාව දිනකට පැය 16 කට නොවැඩි විය යුතු ය. සතියක් තුළදී ආයතනය ක්‍රියාත්මක වන සම්මත පැය ගණන පිළිබඳ කාල සටහනක් මෙහිදී ලබා දිය යුතු ය. |

## *III වැනි කොටස*

| *තොරතුරු* | *විස්තරය* |
|---|---|
| සීමා කර ඇති මෙහෙයුම් කටයුතු : | බලශක්ති දත්ත වාර්තා කරනු ලබන කාර්තුවේදී ක්‍රියාත්මක නොවන මහල් හා ගොඩනැගිලි පිළිබඳ විස්තර |
| ලබාගත යුතු පිල් ලකුණ : | වර්ෂයකට වර්ගමීටරයකට කි. වො. පැය 180 |
| වාර්තා කළ යුතු කාල පරාසය : | ලිත් වර්ෂයක සෑම කාර්තුවකටම වරක්, කාර්තුව අවසාන වී දින 14ක් ඇතුළත |

## *IV වැනි කොටස*

### සාමාන්‍ය තොරතුරු

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනයේ තොරතුරු : | ආයතනයේ නම : | | | | | | | | | | |
| | ව්‍යාපාර ලියාපදිංචි අංකය : | | | | | | | | | | |
| | කොටස : G/K අංශය : 47/64 කාණ්ඩය : 471/641/649 පන්තිය : අනවශ්‍ය කොටස් කපා හරින්න* | | | | | | | | | | |
| | ප්‍රධාන ව්‍යාපාර මෙහෙයුම් : (විස්තර කරන්න) : | | | | | | | | | | |
| | ලිපිනය : | | | | | | | | | | |
| | දුරකථන අංකය : | | | | | | | | | | |
| | විද්‍යුත් ලිපිනය : | | | | | | | | | | |
| | වෙබ් අඩවිය : | | | | | | | | | | |
| විදුලි ගිණුමේ තොරතුරු : | ගිණුම් අංකය | | | | | | | | | | |
| | විදුලි අය ක්‍රමය : | | | | | | | | | | |
| | විදුලි සැපයුම්කරු සම්බන්ධ වන ස්ථානය : | | | | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිමාවේ කළමනාකරුගේ තොරතුරු : | නිමාවේ කළමනාකරුගේ නම : | | | | | | | | | |
| | ලිපිනය : | | | | | | | | | |
| | දුරකථන අංකය : | | | | | | | | | |
| අත්සන | විද්‍යුත් ලිපිනය : | | | | | | | | | |
| බලශක්ති කළමනාකරුගේ තොරතුරු : | බලශක්ති කළමනාකරුගේ නම : | | | | | | | | | |
| | යෙදී සිටින ස්වභාවය : අභ්‍යන්තර සේවකයෙකු /බාහිරෙන් ලබාගත් සේවකයෙකු | | | | | | | | | |
| | ලියාපදිංචි අංකය : | | | | | | | | | |
| | ලිපිනය : | | | | | | | | | |
| | දුරකථන අංකය : | | | | | | | | | |
| අත්සන | විද්‍යුත් ලිපිනය : | | | | | | | | | |

## II වන උපලේඛනය

## විස්තරාත්මක බලශක්ති පරිභෝජන වාර්තාව

(නියෝග 3(2))

1. කාර්යාල කටයුතු සිදුවන කාලය

| | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා | සෙනසුරාදා | ඉරිදා | නිවාඩු දින |
|---|---|---|---|---|---|---|---|---|
| ආරම්භ කරන වේලාව | | | | | | | | |
| අවසන් කරන වේලාව | | | | | | | | |

2. බලශක්ති පද්ධති

විදුලිය (නාමික පරිභෝජනය)

| | | | | | |
|---|---|---|---|---|---|
| ජාලගත | | මසකට කි. වො. පැය | ස්වයං උත්පාදිත | | මසකට කි. වො. පැය |
| ගිවිසගත් ඉල්ලුම | | kVA | ඩීසල් උත්පාදිත | | කි. වො. (ධාරිතාව) |
| | | | සූර්ය පැනල මගින් | | කි. වො. (ධාරිතාව) |

ද්‍රවමය ඉන්ධන (නාමික පරිභෝජනය)

| | | |
|---|---|---|
| ඩීසල් | | මසකට ලීටර් |
| භූමිතෙල් | | මසකට ලීටර් |
| වෙනත් | | |

වායුමය ඉන්ධන (නාමික පරිභෝජනය)

| | | |
|---|---|---|
| LP වායු | | මසකට කිලෝග්‍රෑම් |
| ජීව වායු | | මසකට ඝන මීටර |
| වෙනත් | | |

ඝන ඉන්ධන (නාමික පරිභෝජනය)

| | | | | | |
|---|---|---|---|---|---|
| ගල් අඟුරු | | මසකට කිලෝග්‍රෑම් | දැව | | මසකට කිලෝග්‍රෑම් |
| ජෛවස්කන්ධ | | මසකට කිලෝග්‍රෑම් | ලී කුඩු | | මසකට කිලෝග්‍රෑම් |
| | | | පිදුරු | | මසකට කිලෝග්‍රෑම් |
| | | | වෙනත් | | |

3. නිමාවේ සංයුතිය

| ගොඩනැගිලි ඒකකය හඳුනාගැනීම | සම්පූර්ණ බිම් ප්‍රමාණය වර්ග මීටර | සේවා සපයන බිම් ප්‍රමාණය (වර්ග මීටර) | |
|---|---|---|---|
| | | වායු සමනය කරන ලද | වායු සමනය නොකරන ලද |
| | | | |
| | | | |

4. බලශක්ති පරිභෝජන දත්ත

විදුලි පරිභෝජනය

| වාර්තා කෙරෙන කාල පරාසය | ජාලගත විදුලිය | | ස්වයං උත්පාදිත විදුලිය (කි. වො. පැය) | |
|---|---|---|---|---|
| | kVA | කි. වො. පැය | ඩීසල් මගින් | ප්‍රකාශ වෝල්ටීය සූර්ය පැනල මගින් |
| ජනවාරි | | | | |
| පෙබරවාරි | | | | |
| මාර්තු | | | | |

ද්‍රවමය ඉන්ධන පරිභෝජනය (ලීටර්)

| වාර්තා කෙරෙන කාල පරාසය | ඩීසල් (ජෙනරේටර්) | ඩීසල් | දැවි තෙල් | භූමිතෙල් | වෙනත් |
|---|---|---|---|---|---|
| ජනවාරි | | | | | |
| පෙබරවාරි | | | | | |
| මාර්තු | | | | | |

වායුමය සහ ඝන ඉන්ධන පරිභෝජනය (කිලෝග්‍රෑම්)

| වාර්තා කෙරෙන කාල පරාසය | LP වායු | ජීව වායු | ගල් අඟුරු | දැව | වෙනත් |
|---|---|---|---|---|---|
| ජනවාරි | | | | | |
| පෙබරවාරි | | | | | |
| මාර්තු | | | | | |

5. නිෂ්පාදන / සේවා තොරතුරු

| නිෂ්පාදන | නිෂ්පාදන/ සේවා විස්තරය | මනිනු ලබන ඒකකය |
|---|---|---|
| නිෂ්පාදන 1 | | |
| නිෂ්පාදන 2 | | |

| නිෂ්පාදන | නිෂ්පාදන/ සේවා විස්තරය | මනිනු ලබන ඒකකය |
|---|---|---|
| නිෂ්පාදන 3 | | |
| | | |
| සේවා 1 | | |
| සේවා 2 | | |

6. නිෂ්පාදන / සේවා දත්ත

| වාර්තා කෙරෙන කාල පරාසය | නිෂ්පාදන / සේවා ප්‍රමාණය | | | | |
|---|---|---|---|---|---|
| | නිෂ්පාදන 1 | නිෂ්පාදන 2 | නිෂ්පාදන 3 | සේවා 1 | සේවා 2 |
| ජනවාරි | | | | | |
| පෙබරවාරි | | | | | |
| මාර්තු | | | | | |

7. නිශ්චිත බලශක්ති පරිභෝජනය (එස් ඊ සී)


| |
|---|
| |

**III වන උපලේඛනය**

**නිමාවක බලශක්ති කාර්ය සාධන ශ්‍රේණිගත කිරීම්**

(නියෝග 3(9))

| I තීරුව | II තීරුව | | | | | |
|---|---|---|---|---|---|---|
| නිශ්චිත බලශක්ති පරිභෝජනය (SEC) වර්ෂයකට වර්ගමීටරයකට කි. වො. පැය | ශ්‍රේණිගත කිරීම් | | | | | |
| SEC ≤ 90 | තරු ලකුණු 5 | ★ | ★ | ★ | ★ | ★ |
| 90 < SEC ≤120 | තරු ලකුණු 4 | ★ | ★ | ★ | ★ | |
| 120 < SEC ≤140 | තරු ලකුණු 3 | ★ | ★ | ★ | | |
| 140 < SEC ≤160 | තරු ලකුණු 2 | ★ | ★ | | | |
| 160 < SEC ≤180 | තරු ලකුණු 1 | ★ | | | | |
| SEC > 180 | අනුකූල වී නොමැත | | | | | |




නිශ්චිත බලශක්ති පරිභෝජනය (SEC) (වර්ෂයකට වර්ගමීටරයකට කි.වො. පැය)

EOG 07 - 0009